**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර.**

# විශ්වවිද්‍යාල ප්‍රවේශය

## 2022/2023 අධ්‍යයන වර්ෂය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, බුදුන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, බෞද්ධ ඉගැන්වීම් ප්‍රායෝගිකව පුහුණු කිරීම හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, ථෙරවාදී බුද්ධ ධර්මය ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල ප්‍රචාරය කිරීමට භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, තුලනාත්මක සමය අධ්‍යයනය, බුද්ධ ධර්මය පිළිබඳ පර්යේෂණ කිරීමට ධෛර්යය දීම යනාදී පරමාර්ථ ඉටු කර ගැනීමේ අරමුණින් සංස්ථාපනය කරන ලද උසස් අධ්‍යාපන ආයතනයකි.

ඒ සඳහා මෙම විශ්වවිද්‍යාලය මගින් පහත සඳහන් උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ.

- ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව (SLQF Level 6 / NVQ Level 7 ) - වසර 04
- බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව (SLQF 6 / NVQ Level 7 ) - වසර 04
- ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව (SLQF 5 / NVQ Level 7) - වසර 03

**<u>බඳවාගනු ලබන ආකාරය</u> :-**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා 2019, 2020, 2021 හෝ 2022 යන වර්ෂවල දී පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් සපුරා ඇති භික්ෂූන් වහන්සේලාගෙන් හා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් සමත් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ලබාගත් ඉසෙඩ් (Z-Score) ලකුණුවල ප්‍රමුඛතාව මත සම්මුඛ පරීක්ෂණයකට ලක් කර එහි දී ලබාගත් ලකුණු පදනම් කරගෙන සිසුන් බඳවා ගනු ලැබේ.
- අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත බඳවාගන්නා සිසුන් සාමාන්‍ය පොදු පරීක්ෂණයේදී 30% හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම අනිවාර්ය වේ.
- මේ හැර ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් සමත් භික්ෂූන් වහන්සේලා ද තෝරාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 10%ක් වන අනුපාතයට බඳවා ගනු ලැබේ.

**<u>ප්‍රවේශ සුදුසුකම්</u>**

| | | |
|---|---|---|
| 01. | බෞද්ධ විහාර දේවාලගම් පනතේ නියමයන්ට අනුකූලව ලියාපදිංචි වූ භික්ෂූන් වහන්සේ නමක් වීම | |
| | | **හා** |
| 02. | i) | බුද්ධ ධර්මය/බෞද්ධ ශිෂ්ටාචාරය සහ පාලි/ සංස්කෘත/ වෙනත් භාෂා විෂයයක් සහිතව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම. |
| | | **හෝ** |
| | ii) | ප්‍රාචීන මධ්‍යම විභාගය සමත් වී තිබීම.<br><br>(විශ්වවිද්‍යාලයට තෝරා ගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 10%ක් වන අනුපාතයට ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් භාෂාත්‍රයෙන් සමත් භික්ෂූන් වහන්සේලා බඳවා ගනු ලැබේ.) |

| | | |
|---|---|---|
| | | **හෝ** |
| | iii) | බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත යන විෂයයන්ගෙන් එක් විෂයයක්වත් ඇතුළුව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම. |
| | | **හෝ** |
| | iv) | ඕනෑම කලා විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම.<br><br>බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත යන විෂයයක් යටතේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් (වසරක හෝ ඊට වැඩි) ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම. (SLQF Level 3 / NVQ Level 5 ) |
| | | **හෝ** |
| | v) | ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම.<br><br>ඉහත අංක i, ii, iii හා iv යටතේ සුදුසුකම් සපුරා ඇති ස්වාමින් වහන්සේලා ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් පමණක් අංක (v) යටතේ සුදුසුකම් ඇති ස්වාමින් වහන්සේලා බඳවා ගැනීමට සලකා බලනු ලැබේ. |

**අයදුම්පත් ලබා ගැනීම හා යොමු කිරීම.**

www.busl.ac.lk විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවියෙන් බා ගත කරගනු ලැබූ අයදුම්පත නිසිපරිදි සම්පූර්ණ කොට අදාළ ලේඛනවල සහතික කළ පිටපත් හා අනුරාධපුර මහජන බැංකුවේ 008-1001-5001-4462 අංක දරන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය පුනරාවර්තන ගිණුමට රු.200.00 මුදලක් බැරකර ලබාගත් ලදුපත ද සමග **2023.10.13** දින හෝ එදිනට පෙර ලැබෙන සේ **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා), ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ශීඝ්‍රගාමී තැපැල් (Courier service) මගින් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"විශ්වවිද්‍යාල ප්‍රවේශය (අභ්‍යන්තර) - 2022/2023"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**මහෝපාධ්‍යායයන් වහන්සේ,**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,**
**අනුරාධපුර.**
2023.09.10